**මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය සේවක සේවයේ**

**බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය - සංශෝධන අංක 01**

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|
| 9.2.2.2 | ii. කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.<br><br>iii. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම | ii. කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.<br><br>හෝ<br><br>iii. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම | 9.2.2.2. ඡේදයේ ii වන හා iii වෘත්තිය සුදුසුකම් අතර "හෝ" යන පාඨය ඇතුලත් නොවී තිබීම නිසා අදාළ පාඨය ඇතුලත් කිරීම. |
| 14 | **සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම**<br>(ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.)<br><br>නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් ලබා දී ඇති PL 1 - 2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියලු දෙනාම නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට ලබා සිටි PL 1 - 2016 වැටුප් පරිමාණයේ අදාල ශ්‍රේණිය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 04 වන වගන්තියේ වැටුප් පරිවර්තන ක්‍රමවේදයට අනුව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br>සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට | **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රණය කිරීම**<br>මෙම පරිපාටිය ක්‍රියාක්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.<br><br>නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 මගින් ලබා දී ඇති PL -02-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රණය කරනු ලැබේ.<br><br>සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙන ය. කෙසේ වුව ද, අන්තර්ග්‍රණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක | PL -02 යටතේ වැටුප් ලබන සේවකයින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අන්තර්ග්‍රණය කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-01-07 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| | පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේවතුදු, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද නොකළ යුතුය.<br><br>I. PL 2 - III ශ්‍රේණිය<br>PL 1 - 2016 වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබන සේවකයින් PL 2 - 2016 හි III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br><br>II. PL 2 - II ශ්‍රේණිය<br>PL 1 - 2016 වැටුප් පරිමාණය යටතේ II ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබන සේවකයින් PL 2 - 2016 හි II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br><br>III. PL 2 - I ශ්‍රේණිය<br>PL 1 - 2016 වැටුප් පරිමාණය යටතේ I ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබන සේවකයින් PL 2 - 2016 හි I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br><br>IV. PL 2 - විශේෂ ශ්‍රේණිය<br>PL 1 - 2016 වැටුප් පරිමාණය යටතේ විශේෂ ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබන සේවකයින් PL 2 - 2016 හි විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. | දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම සිදු නොකළ යුතුය.<br><br>i. PL -02 - III ශ්‍රේණිය<br><br>(අ) PL -02-2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති සේවකයින්,<br><br>(ආ) PL-02-2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්,<br><br>PL -02 - III ශ්‍රේණියට අන්තර්ග්‍රණය කරනු ලැබේ.<br><br>ii. PL -02 - II ශ්‍රේණිය<br><br>(අ) ඉහත සඳහන් පරිදි PL 2 – 2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10)කට නොඅඩු එහෙත් අවුරුදු විස්ස(20)කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-01-07 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| | | එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක දහය(10)ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති සේවකයින්,<br><br>(ආ) PL -02-2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති සේවකයින්,<br><br>(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක් සම්පූර්ණ වුව ද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්,<br><br>PL -02 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br><br>iii. PL -02 - I ශ්‍රේණිය<br><br>(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු තිහ(30)ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන් ම අවම වශයෙන් අවුරුදු විස්ස(20) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක විස්ස(20) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-01-07 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| | ගරු ආණ්ඩුකාරතුමා විසින්<br>2025-01-07 දින<br>අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සෙසු සුදුසුකම් සපුරා ඇති සේවකයින්,<br><br>(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවයක (09) හෝ ඊට වැඩි එහෙත් අවුරුදු දහ නවයක(19)කට අඩු සේවා කාලයක් ඇති, එමෙන් ම අවම වශයෙන් අවුරුදු නවය(09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක නවයක්(09) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සෙසු සුදුසුකම් සපුරා ඇති සේවකයින්,<br><br>(ඇ) PL -02-2016 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය(09)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති සේවකයින්,<br><br>(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය(09) ක් සම්පූර්ණ වූව ද විශේෂ ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්,<br><br>PL -02 - I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br><br>iv. PL -02 - විශේෂ ශ්‍රේණිය<br><br>(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු තිහ(30)ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන් ම අවම මශයෙන් අවුරුදු තිහක (30) ක | |

| | | | |
|---|---|---|---|
| | | සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක තිහ(30) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සෙසු සුදුසුකම් සපුරා ඇති සේවකයින්,<br><br>(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහ නවයක (19) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන් ම අවම වශයෙන් අවුරුදු දහ නවයක (19) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක දහ නවයක (19) උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සෙසු සුදුසුකම් සපුරා ඇති සේවකයින්,<br><br>(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය(09) ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන් ම අවම වශයෙන් අවුරුදු නවය(09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක නවය(09)ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සෙසු සුදුසුකම් සපුරා ඇති සේවකයින්,<br><br>(ඈ) PL -02 – 2016 වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක් හෝ ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන සේවකයින්,<br><br>PL -02 - විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-01-07 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

| | | |
|---|---|---|
| 1. ගාමිණී රාජකරුණා මහතා | (සභාපති) | ……………………………… |
| 2. පී.ටී.ජී.ගුණතිලක මහතා | (සාමාජික) | ……………………………… |
| 3. සී.පී.එස්. ඉලංගසිංහ මහතා | (සාමාජික) | ……………………………… |
| 4. ටී.බී.එම්.එස්.ඩී.තෝරදෙණිය මිය | (සාමාජික) | ……………………………… |
| 5. ජී.එල්.ජී.තිස්ස ජී.මාරගෙහෙල මහතා | (සාමාජික) | ……………………………… |

දිනය - 2024/12/03

ආණ්ඩුකාර ලේකම්,

2024.12.03 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2024/2521 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනයන්හි ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය සේවක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධන අංක - 01" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය - 2024/12/05

………………………………

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත.

නිල මුද්‍රාව - කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-01-07 දින අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනයන්හි ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය සේවක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධන අංක - 01 අනුමත කරමි./ අනුමත නොකරමි.

දිනය - 2025-0[illegible]-07

(signature)

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර.

සරත් බී.එස්. අභයකෝන්
(BScEng, M.A.Sc., Ph.D, CEng, IntPE, FIESL, FNASSL)
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය